# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

## ගිණුම්කරණය - 33

### නිපුණතාව 03

ද්විත්ව සටහන් ක්‍රමය අනුව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කරයි

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ගාමිණී හරිස්චන්ද්‍ර මයා


ර/ විද්‍යාලෝක මධ්‍ය මහා විද්‍යාලය

වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

## 03) ද්විත්ව සටහන් ක්‍රමය අනුව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කරයි

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල |
|---|---|---|
| 3.1 ගණුදෙනු ගිණුම්ගත කිරීම සඳහා ද්විත්ව සටහන් රීති අනුගමනය කිරීමේ වැදගත්කම අනාවරණය කරයි.<br><br>3.2 ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කරයි | • ගනුදෙනුවක ද්විත්ව ස්වරූපය<br>• ද්විත්ව සටහන් ක්‍රමය<br>• ගිණුම , එහි ආකෘතිය හා ලෙජරය<br>• පොදු ලෙජරය<br>• උප ලෙජර<br>• මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග හා ගිණුම්වර්ග<br>• වත්කම්<br>• වගකීම්<br>• හිමිකම<br>• ආදායම්<br>• වියදම් | • ගනුදෙනුවක ද්විත්ව ස්වරූපය පැහැදිලි කරයි.<br>• ද්විත්ව සටහන් ක්‍රමයේ ආරම්භය හා ද්විත්ව සටහන් ක්‍රමය පැහැදිලි කරයි.<br>• ද්විත්ව සටහන් රීති ඉදිරිපත් කරයි.<br>• ගිණුම හා ආකෘතිය පැහැදිලි කරයි.<br>• ලෙජරයේ ගිණුම් වර්ග නම් කරයි.<br>• ගනුදෙනු ද්විත්ව සටහන් න්‍යාය මත ගිණුම්වල සටහන් කරයි.<br>• මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග නම් කරයි |

**ද්විත්ව සටහන් ක්‍රමය කුමක්ද යන්න හඳුනා ගනිමු**



ගනුදෙනුවක ද්විත්ව මූල්‍ය ප්‍රතිඵලය ද්විත්ව සටහන් මූලධර්මය මත පදනම වන අතර, මෙය ක්‍රි. ව. වර්ෂ 1494 දී ඉතාලි ජාතික ලූකා පැසියෝලි (Luca Pacioli) පියතුමා විසින් මුල් වරට ඉදිරිපත් කරනු ලැබීය.

## ඒ අනුව ද්විත්ව සටහන් ක්‍රමය හා මූලධර්මය යනු

ගනුදෙනුවල ද්විත්ව මූල්‍ය ප්‍රතිඵලය ව්‍යාපාරය කෙරෙහි දෙයාකාරයකට බලපාන බවත්, එකී බලපෑම එකවර සටහන් කරන ක්‍රමය ''ද්විත්ව සටහන් ක්‍රමය'' නම් වේ.

සෑම ගනුදෙනුවක ම ද්විත්ව ස්වරූපය ගිණුම්වලට පිටපත් කළ යුතු ආකාරය ද්විත්ව සටහන් මූලධර්මයෙන් කියවෙන අතර, එම ද්විත්ව ප්‍රතිඵලය **හර හා බැර** වශයෙන් එකවර සටහන් කිරීමට අනුගමනය කරන රීතීන් සමූහය ද්විත්ව සටහන් මූලධර්ම වේ.

**මූල්‍ය ප්‍රකාශන මූලිකාංග**

1) **වත්කම්**
2) **වගකීම්**
3) **හිමිකම්**
4) **ආදායම්**
5) **වියදම්**

ව්‍යාපරයක සිදුවන ඕනෑම ගණුදෙනුවක් මෙම මූලිකාංග 5 ට අනුව ගිණුම් දෙකක හර හා බැර වශයෙන් සටහන් වේ. මේ අනුව

| | | |
|---|---|---|
| වත්කම් වැඩිවීම - හර | හිමිකම් වැඩිවීම -- බැර | වියදම් වැඩිවීම - හර |
| වත්කම් අඩුවීම - බැර | හිමිකම් අඩුවීම -- හර | වියදම් අඩුවීම - බැර |
| වගකීම් වැඩිවීම --- බැර | ආදායම් වැඩිවීම -- බැර | |
| වගකීම් අඩුවීම - හර | ආදායම් අඩුවීම -- හර | |

වැඩිවීම -- හර { වත්කම් / වියදම් } අඩුවීම -- බැර

වැඩිවීම -- බැර { වගකීම් / හිමිකම් / ආදායම් } අඩුවීම -- හර

**ගිණුමක් යනු**

ගිණුම්කරණ ඒකකයක ඇති වන මූල්‍යමය ගනුදෙනු වාර්තා කරන සම්මත ආකෘතිය ''ගිණුම'' වේ. එහි දී ව්‍යාපාරික ගනුදෙනු හා සිදුවීම්වල ද්විත්ව ස්වරූපය නිශ්චිත දිනක සිට තවත් නිශ්චිත දිනයක් දක්වා අනුපිළිවෙළින් වාර්තා කරනු ලැබේ.

සම්ප්‍රදායික ලෙජර් ගිණුමක ආකෘතිය ඉංග්‍රීසි අකුරක " T " හැඩය ගන්නා අතර භාවිතයේ දී ඒ සඳහා පහත ස්වරූපයක් උපයෝගී කර ගනියි.

**ගිණුමක ආකෘතිය පහතින් දැක්වේ**

1)

| හර | බැර |
|---|---|
| | |

T ගිණුම තවත් විස්තරාත්මක ලෙස පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කරණු ලැබේ

............................................ **ගිණුම**

හර බැර

| දිනය | විස්තරය | සගල පිටුව | වටිනාකම රු. | දිනය | විස්තරය | සගල පිටුව | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ගිණුමක් සිරස් ආකාරයටද ඉදිරිපත් කළ හැක එහි ආකෘතිය පහත දැක්වෙන පරිදි වේ

............................................ **ගිණුම**

| දිනය | විස්තරය | සගල පිටුව | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| | | | | | |

## ලෙජරය

ගිණුම් සියල්ල එකතු වන ස්ථානය **ලෙජරය** නම් වේ. එය පොතක්, ලිපි ගොනුවක්.විද්‍යුත් පත්‍රිකාවක් හෝ කාඩ් පතක් විය හැකි ය.

උදා : පරිගණකගත ආයතනයක ගනුදෙනු වාර්තා, චුම්බක පටියක (Magnetic tape) හෝ චුම්බක තැටියක (Magnetic Disc) සටහන් කිරීම.

- ව්‍යාපාරික ගනුදෙනුවලින් මතුවන ලෙජර් ගිණුම් වර්ග 5කි. එනම්

**වත්කම්,**

**වියදම්,**

**වගකීම්,**

**ආදායම් හා**

**හිමිකම් ගිණුම් වේ.**

- ඒ ඒ ගිණුම්වල වටිනාකම් අඩුවීම හා වැඩිවීම පහත අයුරු සාරාංශ කළ හැකි ය.

**වත්කම් හා වියදම් ගිණුම්**

| හර | බැර |
|---|---|
| වැඩිවීම + | අඩුවීම - |
| සාමාන්‍ය ශේෂය | |

**ප්‍රාග්ධනය(හිමිකම්) ආදායම් හා වගකීම් ගිණුම්**

| හර | බැර |
|---|---|
| අඩුවීම - | වැඩිවීම + |
| | සාමාන්‍ය ශේෂය |

**අභ්‍යාස අංක 01**

| ගනුදෙනුව | ද්විත්ව සටහන් රීතිය | ද්විත්ව සටහන (රු.) |
|---|---|---|
| 1. ව්‍යාපාරය ආරම්භ කිරීමට අයිතිකරු රු. 200 000 ක් යෙදවීම | වත්කම් වැඩිවීම- හර<br><br>හිමිකම් වැඩිවීම - බැර | මුදල් ගිණුම - හර 200 000<br><br>ප්‍රාග්ධන ගිණුම - බැර 200 000 |
| **2. රු. 35 000 ක ලීබඩු ගැනීම** | | |
| **3. රු. 80 000 ක භාන්ඩ අත්පිට මුදලට ගැනීම** | | |
| **4. විදුලි බිල් ගෙව්වා රු. 7 000 යි** | | |
| **5. අත්පිට විකුණුම් රු 60 000 යි** | | |
| **6. රු 40 000 ක භාන්ඩ ණයට ගැනිම** | | |
| **7. රු  50 000 ක භාණ්ඩ ණයට විකිනීම** | | |
| **8. ණයහිමියන්ට මුදල් ගෙව්වා රු 25 000 යි** | | |
| **9. ණයගැතියන්ගෙන් මුදල් ලැබුනා රු 35 000 යි** | | |
| **10. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු 10 000 ක් ව්‍යාපාරයෙන් ගැනීම** | | |

## ගණුදෙනු ද්විත්ව සටහන් ක්‍රමය මත ගිණුම්වල සටහන් කිරීම

**පහත දැක්වෙන්නේ ලෝචනගේ ව්‍යාපාරයේ 2021 අප්‍රේල් මාසයට අදාලව සිදුවූ ගණුදෙනු වේ.**

**2021/04/01 ප්‍රාග්ධනය ලෙස මුදලින් රු 500 000 ක් හා රු 800 000 ක් වටිනා ඉඩම හා ගොඩනැගිල්ල ව්‍යාපාරයට යෙදවීම**

**2021/04/03 අත්පිට ගැනුම් රු 50 000 යි**

**2021/04/05 ලී බඩු උපකරණ මිලදී ගත්තා රු 40 000**

**2021/04/07 අත්පිට මුදලට විකුණුම් රු 70 000**

**2021/04/10 විදුලි බිල ගෙව්වා රු 1 000**

**2021/04/12 බැංකු ණයක් ගත්තා රු 200 000**

**2021/04/15 සේවක වැටුප් ගෙව්වා රු 5 000**

**2021/04/17 ලෝචන පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ගත්තා රු 2 000**

**2021/04/20 බැංකු ණයෙන් රු 12 000 ක වාරිකයක් හා රු 2 000 ක පොලිය ගෙව්වා**

**2021/04/25 අරුණට විකුණුම් රු 80 000**

**2021/04/28 අතුලගෙන් ගැනුම් රු 30 000**

**2021/04/29 අරුණගෙන් ලද මුදල රු 20 000**

**ඉහත ගණුදෙනු පොදු ලෙජරයේ සටහන් කිරීම පහත දැක්වේ**

මුදල් පාලන ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| 4/1 | ප්‍රාග්ධන | 500 | 4/3 | ගැනුම් | 50 |
| 4/7 | විකුණුම් | 70 | 4/5 | ලීබඩු | 40 |
| 4/12 | බැංකු ණය | 200 | 4/10 | විදුලිය | 1 |
| 4/29 | ණයගැති පාලන | 20 | 4/15 | වැටුප් | 5 |
| | | | 4/17 | ගැනිලි | 2 |
| | | | 4/20 | ණය වාරික | 12 |

**ණය පොලිය 2**

ප්‍රාග්ධන ගිණුම රු 000

| | |
|---|---|
| | 4/1 මුදල් 500 |
| | 4/1 ඉඩම් ගොඩනැ.800 |

ඉඩම් හා ගොඩනැගිලි රු 000

| | |
|---|---|
| 4/5 ප්‍රාග්ධන 40 | |

l

ලී බඩු උපකරණ ගිණුම රු 000

| | |
|---|---|
| 4/5 මුදල් 40 | |

### ගැනුම් ගිණුම

රු 000

| | |
|---|---|
| 4/3 මුදල් 50 | |
| 4/3 ණයහිමි පාලන 30 | |

### විදුලි වියදම් ගිණුම

රු 000

| | |
|---|---|
| 4/10 මුදල් 1 | |

### බැංකු ණය පොළී ගිණුම

රු 000

| | |
|---|---|
| 4/12 මුදල් 2 | |

බැංකු ණය ගිණුම රු 000

| | | | | | |
|---|---|---|---|---|---|
| 4/12 | මුදල් | 12 | 4/12 | මුදල් | 200 |

ණයගැති පාලන රු 000

| | | | | | |
|---|---|---|---|---|---|
| 4/25 | විකුණුම් | 80 | | | |

ණයහිමි පාලන රු 000

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 4/3 | ගැනුම් | 30 |

වැටුප් ගිණුම

රු 000

| | |
|---|---|
| 4/15 මුදල් 5 | |

ගැනිලි

රු 000

| | |
|---|---|
| 4/17 ගැනිලි 2 | |

විකුණුම් ගිණුම

රු 000

| | |
|---|---|
| | 4/7 විකුණුම් 70 |
| | 4/7 ණයගැති පාලන 80 |

**ශේෂ පිරික්සුම**

| ගිණුම | හර රු | බැර රු |
|---|---|---|
| | | |

**අභ්‍යාස අංක 02**

පහත දැක්වෙන්නේ සිරිමල්ගේ ව්‍යාපාර ආයතනයේ සිදු වූ ගනුදෙනුවල ද්විත්ව සටහන් කිහිපයකි. ඊට සම්බන්ධ ගනුදෙනුව නම් කරන්න.

| ද්විත්ව සටහන | | රු. | රු. | ගණුදෙනුව |
|---|---|---|---|---|
| 01) මුදල් ගිණුම<br>ප්‍රාග්ධන ගිණුම | හර<br>බැර | 400 000 | <br>400 000 | |
| 02) ගොඩනැගිලි ගිණුම<br>ප්‍රාග්ධන ගිණුම | හර<br>බැර | 500 000 | <br>500 000 | |
| 03) මුදල් ගිණුම<br>බැංකු ණය ගිණුම | හර<br>බැර | 200 000 | <br>200 000 | |
| 04) ගැණුම් ගිණුම<br>මුදල් ගිණුම | හර<br>බැර | 80 000 | <br>80 000 | |
| 05) ගැනුම් ගිණුම<br>නයහිමි පාලන ගිණුම | හර<br>බැර | 50 000 | <br>50 000 | |
| 06) විදුලි වියදම් ගිණුම<br>මුදල් ගිණුම | හර<br>බැර | 15 000 | <br>15 000 | |
| 07) මුදල් ගිණුම<br>දුන් වට්ටම් ගිණුම<br>ණයගැති පාලන ගිනුම | හර<br>හර<br>බැර | 28 000<br>2 000 | <br><br>30 000 | |
| 08) ණයහිමි පාලන ගිණුම<br>මුදල් ගිණුම<br>ලද වට්ටම් ගිණුම | හර<br>බැර<br>බැර | 25 000 | <br>22 000<br>3 000 | |
| 09) ගැනිලි ගිණුම<br>මුදල් ගිණුම<br>ගැණුම් ගිණුම | හර<br>බැර<br>බැර | 15 000 | <br>10 000<br>5 000 | |
| 10) බැංකු ණය ගිණුම<br>පොලී ගිණුම<br>මුදල් ගිණුම | හර<br>හර<br>බැර | 30 000<br>5 000 | <br><br>35 000 | |

**අභ්‍යාස අංක 03**

(01) ද්විත්ව සටහන් රීතිය **නිවැරදිව දක්වා නැති** වගන්තිය දැක්වීම.

(i) වත්කම් හා වියදම් වැඩිවීම හර

(ii) වගකීම් හිමිකම් හා ආදායම් වැඩිවීම බැර

(iii) වත්කම් හා වියදම් අඩුවීම හර

(iv) වගකීම් හිමිකම් හා ආදායම් අඩුවීම හර

(v) වත්කම් හා වියදම් අඩුවීම බැර

(02) ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන **නිවැරදිව දක්වා ඇති** වගන්තිය දැක්වීම.

(i) අත්පිට මුදලට බඩු ගත්තා. රු. 20 000 යි.

ගැනුම් ගිණුම හර - මුදල් ගිණුම බැර

(ii) ණයට බඩු ගත්තා. රු. 30 000 යි.

තොග ගිණුම හර. ණය ගැති ගිණුම බැර

(iii) අත්පිට මුදලට බඩු විකුණුවා. රු. 50 000 යි.

විකුණුම් ගිණුම හර - තොග ගිණුම බැර

(iv) ණයට බඩු විකුණුවා. රු. 40 000 යි. -

විකුණුම් ගිණුම හර - ණයගැති ගිණුම බැර

(v) දුරකතන බිල ලැබුණා. රු. 2 000 යි.

දුරකතන වියදම් ගිණුම හර - මුදල් ගිණුම බැර

(03) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද / අසත්‍යය ද යන්න දක්වීම.

1. ගිණුම්කරණයේ පියා ලූකා පැසියෝලි සාමිවරයා ය. ( )

2. ගනුදෙනු හා සිද්ධින්වල ද්විත්ව බලපෑම ගිණුම්වල වාර්තා කරන්නේ ද්විත්ව සටහන් රීතිය පදනම් කර ගෙනයි. ( )

3. හිමිකම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය හා වගකීම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය එකිනෙකට වෙනස් වේ. ( )

4. භාණ්ඩ ගැනිලි හිමිකම අඩු කරයි. ( )

5. ගිණුම් කාලච්ඡේදයක් තුළ දී උපයන ශුද්ධ ලාභය අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලනොපායි. ( )

**අභ්‍යාස අංක 04**

අමල්ගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ

1/1 අමල් මුදලින් රු 500 000 ක් යොදා සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් ඇරඹීම.

1/3 රු 100 000 ක භාණ්ඩ අත්පිට ගැනීම.

1/5 අත්පිට විකුනුම් රු 40 000 යි.

1/7 සිරිල්ගෙන් රු 50 000 ක භාණ්ඩ ණයට ගැනිම.

1/9 කමල්ට රු 50 000 ක භාණ්ඩ ණයට විකිනීම.

1/11 විදුලි බිල් ගෙව්වා රු 10 000 යි.

1/13 ජනවාරි මාසයට අදාල දුරකතන බිල ලැබුනා රු 7 000 යි

1/15 රු 50 000 ක ගෘහ භාණ්ඩ කුරේ සමාගමෙන් නයට ගත්තා.

1/17 රු 150 000 ක ණයක් මහජන බැංකුවෙන් ගැනීම.

1/20 අත්පිට විකුනුම් රු 30 000 යි.

1/22 අත්පිට ගැනුම් රු 30 000 යි

1/25 සිරිල්ට ගෙවියයුතු රු 30 000 ක් සඳහා රු 28 000 ක් ගෙවීම.

1/27 කමල්ගෙන් ලැබිය යුතු රු 40 000 ක් වෙනුවෙන් රු 37 000 ක් ලැබීම.

1/28 සේවක වේතන ගෙව්වා රු 25 000 යි.

1/29 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදල් රු 10 000 ක්ද භාණ්ඩ රු 5 000 කද ව්‍යාපාරයෙන් ගැනීම

1/31 බැංකු ණය වාරිකය රු 25 000 ක් හා පොලිය රු 5 000 ක් ගෙවීම.

අවයවන්නේ

1) ඉහත ගණුදෙනු ද්විත්ව සටහන් ක්‍රමයට ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

2) ලෙජර් ගිණුම් තුලනය කර ජනවාරි 31 ට ශේෂ පිරික්ෂුමක් පිලියෙල කරන්න

**අභ්‍යාස අංක 05**

සදුන්ගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි 1 දිනට ව්‍යාපාරයේ පැවති වත්කම් වගකීම් හා හිමිකම් පහත දැක්වේ

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු 800 000 |
| මෝටර් රථ | රු 500 000 |
| ගෘහ භාණ්ඩ | රු 100 000 |
| ණයගැතියන් | රු 150 000 |
| මුදල් | රු 200 000 |
| ණයහිමයන් | රු 100 000 |
| බැංකු ණය | රු 200 000 |
| ප්‍රාග්ධනය | රු1350 000 |

ජනවාරි මාසය තුල සිදුවූ ගණුදෙනු පහත දැක්වේ

1/1 නයට භාන්ඩ ගැනුම් රු 80 000

1/3 අත්පිට භාණ්ඩ ගැනුම් රු 60 000

1/5 අත්පිට විකුණුම් රු 50 000

1/8 සේවක වේතන ගෙව්වා රු 30 000

1/10 දුරකතන ගාස්තු ගෙව්වා රු 8 000

1/14 අත්පිට ගැණුම් රු 50 000

1/17 නයට විකුණුම් රු 40 000

1/20 රු 150 000 ක ණයගැතියන්ගෙන් රු 145 000 ක් ලැබීම ඉතිරිය දුන්වට්ටම් වේ

1/22 රු 200 000 ක මොටර් රථයක් සිල්වා සමාගමෙන් ණයට ගැනීම

1/25 රු 80 000 ක ණයහිමයන්ට රු 72 000 ක් ගෙවීම ඉතිරිය ලද වට්ටම් වේ

1/27 බැංකු ණය වාරිකය රු 30 000 ක් හා ඊට අදාල පොලිය රු 7 000 ක් ගෙවීම

1/29 සදුන් මුදලින් රු 15 000 ක් හා භාන්ඩ රු 5000 ක ව්‍යාපාරයෙන් පෞද්ගලික පරිහරනයට ගැනීම

1/31 අත්පිට විකුණුම් රු 60 000

අවයවන්නේ

1) ඉහත ගණුදෙනු ද්විත්ව සටහන් ක්‍රමයට ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

2) ලෙජර් ගිණුම් තුලනය කර ජනවාරි 31 ට ශේෂ පිරික්ෂුමක් පිලියෙල කරන්න

**අභ්‍යාස අංක 06**

**පහත දක්වෙන්නේ සල්ගාදුගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසයට අදාලව සිදුවූ ගණුදෙනු වේ.**

**2021/01/01 ප්‍රාග්ධනය ලෙස මුදලින් රු 600 000 ක් හා රු 1000 000 ක් වටිනා ඉඩම හා ගොඩනැගිල්ල ව්‍යාපාරයට යෙදවීම**

**2021/01/03 අත්පිට ගැනුම් රු 60 000 යි**

**2021/01/05 ලී බඩු උපකරණ මිලදී ගත්තා රු 40 000**

**2021/01/07 අත්පිට මුදලට විකුණුම් රු 60 000**

**2021/01/10 විදුලි බිල ගෙව්වා රු 7 000**

**2021/01/12 බැංකු ණයක් ගත්තා රු 150 000**

**2021/01/15 සේවක වැටුප් ගෙව්වා රු1 5 000**

**2021/01/17 සල්ගාදු පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ගත්තා රු 5 000**

**2021/01/20 බැංකු ණයෙන් රු 12 000 ක වාරිකයක් හා රු 2 000 ක පොලිය ගෙව්වා**

**2021/01/25 සුරන්ට විකුණුම් රු 80 000**

**2021/01/28 අතුලගෙන් ගැනුම් රු 30 000**

**2021/01/29 සුරන්ගෙන් ලැබියයුතු මුදල් රු 40 000 ක් සඳහා රු 38 000 ලැබීම**

**2021/01/31 අත්පිට විකුණුම් රු 30 000**

**ඉහත ගණුදෙනු පොදු ලෙජරයේ සටහන් කිරීම හා ශේෂ පිරික්ෂුම පිළියෙල කරන්න**

**අභ්‍යාස අංක 07**

නුවන්ගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු පහත දක්වේ

1/1 නුවන් මුදලින් රු 800 000 ක් යොදා සිල්ලර වෙළද ව්‍යාපාරයක් ඇරඹීම.

1/3 රු 100 000 ක භාණ්ඩ අත්පිට ගැනීම.

1/5 අත්පිට විකුනුම් රු 50 000 යි.

1/7 කුමාරගෙන් රු 60 000 ක භාණ්ඩ ණයට ගැනිම.

1/9 කමල්ට රු 50 000 ක භාණ්ඩ ණයට විකිනීම.

1/11 විදුලි බිල් ගෙව්වා රු 10 000 යි.

1/13 ජනවාරි මාසයට අදාල දුරකතන බිල ලැබුනා රු 10 000 යි

1/15 රු 70 000 ක ගෘහ භාණ්ඩ කුරේ සමාගමෙන් නයට ගත්තා.

1/17 රු 150 000 ක ණයක් මහජන බැංකුවෙන් ගැනීම.

1/20 අත්පිට විකුනුම් රු 30 000 යි.

1/22 අත්පිට ගැනුම් රු 30 000 යි

1/25 කුමාරට ගෙවියයුතු රු 30 000 ක් සඳහා රු 28 000 ක් ගෙවීම.

1/27 කමල්ගෙන් ලැබිය යුතු රු 40 000 ක් වෙනුවෙන් රු 37 000 ක් ලැබීම.

1/28 සේවක වේතන ගෙව්වා රු 25 000 යි.

1/29 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදල් රු 20 000 ක්ද භාණ්ඩ රු 15 000 කද ව්‍යාපාරයෙන් ගැනීම

1/31 බැංකු ණය වාරිකය රු 30 000 ක් හා පොලිය රු 8 000 ක් ගෙවීම.

අවයවන්නේ

1) ඉහත ගණුදෙනු ද්විත්ව සටහන් ක්‍රමයට ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

2) ලෙජර් ගිණුම් තුලනය කර ජනවාරි 31 ට ශේෂ පිරික්ෂුමක් පිලියෙල කරන්න

# පාඩමට අදාල මූලික පද

| | |
|---|---|
| ආදායම් ප්‍රකාශනය | **Income Statement** |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | **Statement of Financial Position** |
| ජංගම වත්කම් | **Current Assets** |
| ජංගම නොවන වත්කම් | **Non -current Assets** |
| විකුණුම් පිරිවැය | **Cost of Sales** |
| ගැලපුම් සංකල්පය | **Matching Concept** |
| ජංගම වගකීම් | **Current Liabilities** |
| ජංගම නොවන වගකීම් | **Non -current Liabilities** |
| ද්විත්ව සටහන් ක්‍රමය | **Double Entry System** |
| ගිණුම | **Account** |
| ගිණුම් වර්ග | **Branches of Accounting** |
| ලෙජරය | **Ledger** |
| ද්විත්ව බලපෑම | **Dual Aspect / Effect** |
| මූල්‍ය ප්‍රකාශන මූලිකාංග | **Elments of Financial Statements** |
| | |